# කෘෂිකර්ම , පශු සම්පත් හා විහවතා

## වී වගාව

2024 දී යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වගාවට යටවී ඇති මුළු කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර 600 මහා වාරිමාර්ග යටතේ ගොවිතැන් නොකරන අතර , වර්ෂාව මගින් යල,මහ කන්න දෙක වගා කරයි..

**වගා කළ අස්වනු නෙළු කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ අස්වැන්න / නිෂ්පාදන - 2024**

| කුඹුරු බිම් ප්‍රමාණය | අස්වැන්න නිෂ්පාදනය (හෙක්ටයාර) | |
|---|---|---|
| | යල | මහ |
| වැපුරූ මුළු කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් | 1112 | 1302 |
| අස්වැන්න නෙළු මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් | 1080 | - |
| සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට (මෙ.ටො.) | 2.5 | - |
| අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය (බුසල්) | 2195 | 2430 |
| ගොවි ක්ෂේත්‍රයේ බිත්තර වී නිෂ්පාදනය (බුසල්) | 848 | 1188 |
| බාහිරින් අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය (බුසල්) | 1400 | 1410 |

## අනෙකුත් ප්‍රධාන භෝග

## (තේ, රබර්, පොල්)

2024 වර්ෂයේ තේ, රබර්, පොල් ව්‍යාප්තිය (කොට්ඨාසයේ වගාකල බිම් ප්‍රමාණය අක්කර වලින් ) පහත වගුවේ විස්තර වේ. මෙහිදී පොදුවේ තේ වගාකරන ලද බිම් ප්‍රමාණය ඉහල මට්ටමක පවතින බව පෙන්නුම් කරයි

**ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් තේ, රබර්, පොල් භෝග ව්‍යාප්තිය - 2024**

| තේ වගාව අක්/රූඩ්/පර් | පොල් වගාව අක්/රූඩ්/පර් | රබර් වගාව |
|---|---|---|
| නැවත වගාව - 29.34<br>අලුත් වගාව - 6.72 | අක්.18 රූඩ් 02 පර්.08 | අක්. 238.78 |

# තේ පර්යේෂණ ආයතනය කොට්ටව

තලව කැලේ තේ පර්යේෂණ ආයතනයට අනුබද්ධව හෙක්ටයාර් තිස්පහක (35.6) ව්‍යාප්ත වී ඇති මෙය 1960 දී පිහිටුවා ඇත.

ශ්‍රී ලංකා ජාතික ආර්ථිකයට විශාල පිටුවහලක් ලබාදෙන තේ කර්මාන්තයෙහි උන්නතිය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය විශාල දායකත්වයක් ලබාදෙයි. එහි ප්‍රාදේශිය මධ්‍යස්ථානයක් වන ගාල්ල කොට්ටව පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය මගින් පහත සඳහන් කාර්යයන් හා සේවාවන් සපුරාලීමට කටයුතු යොදා ඇත.

- **පර්යේෂණ දායකත්වය**

  තලවකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය , ප්‍රධාන මධ්‍යස්ථානය මගින් මූලික පර්යේෂණ කටයුතු සිදු කිරිමෙන් අනතුරුව ප්‍රාදේශීය අවශ්‍යවන පර්යේෂණ කටයුතු සඳහා දායකත්වය ලබාදීම. (උදා: නව තේ ප්‍රභේද වැඩිදියුණු කිරිම)

- **ව්‍යාප්ති කටයුතු සඳහා දායකත්වය**

  විශාල වතු (අක්කර 50ට වැඩි) සහ කුඩා තේ වතු(අක්කර 10 ට අඩු සම්බන්ධවයි.)

1. වතු සමාගම් පහකට අයත් විශාල වතු 15 ( හෙක්ටයාර් 10000 ක පමණ) ප්‍රධාන වශයෙන් මෙම මධ්‍යස්ථානය මගින් ආවරණය කරන අතර අවුරුද්දකට දෙවතාවක් එම වතු වලට ගොස් උපදෙස් හා වාර්තා සපයනු ලබයි.
2. මීට අමතරව එම වතුසමාගම්වල ඉල්ලීම මත අවශ්‍ය උපදෙස් හා වාර්තා සැපයීම.
3. ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ගේ (හෙක්ටයාර් 27000 ක් පමණ) ඉල්ලීම පරිදි ඔවුන්ගේ ඉඩම් පරික්ෂා කර උපදෙස් ලබාදීම.
4. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරින් හට නව විද්‍යාත්මක දැනුම ලබාදීමට වැඩසටහන් සංවිධානය කිරිම.
5. විශාල තේ ඉඩම් හිමියන් සහ ඔවුන්ගේ සේවක පිරිස් සඳහා ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම.
6. කුඩා තේවතු හිමියන් දැනුවත් කිරිම සඳහා ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම.
7. කර්මාන්ත ශාලා වලට අමු තේ දළු සපයන්නන් දැණුවත් කිරිම . මීට අමතරව තේ වගාකරුවන් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමට සතියේ බදාදා දින වෙන් කර ඇත.
8. තේ ඉඩම් හිමියන්ගේ ඉඩම්වල පස් පරික්ෂා කර PH අගය පිලිබද වර්තා සැපයීම සහ එයට අදාලව ඩොලමයිට් / පොහොර භාවිතය පිළිබදව උපදෙස් ලබාදීම.
9. පාසල් සිසුන් හා උසස් අධ්‍යාපනය හදාරණ සිසුන් සඳහා ව්‍යාපෘති සැකසීමට අවශ්‍ය උපදෙස් හා තොරතුරු ලබාදීම.
10. තේ ක්ෂේත්‍රයේ රැකියාවල නියුක්ත වීමට බලාපොරොත්තු වන්නන් පුහුණු කිරිම.
11. තේ වගාකරුවන් දැනුවත් කිරිම සඳහා තේ සායන පැවැත්වීම. ( Crop Clinics )
12. තේ වගාව සම්බන්ධ තොරතුරු ඇතුලත් පොත්පත් අලෙවි කිරිම.
13. තේ ඉඩම් හිමියන් සහ තේ තවාන්කරුවන් සඳහා නව ප්‍රභේදවල තේ අතු නිකුත් කිරිම.
14. තේ ප්‍රභේද වල පැල නිකුත් කිරිම.
15. දෛනික කාලගුණික තත්ත්වයන් පිළිබඳව තොරතුරු සකස් කිරිම හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරන කටයුතු .

යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රධාන වගාවන් 3.1 සිතියමෙන් දැක්වේ

